මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 අප්‍රේල් 16 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2021 පෙබරවාරි

## සමස්ත නිරීක්ෂණ

පූර්ව වසංගත මට්ටම දක්වා අපනයන වර්ධනය වීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස වැඩි වීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඇති වූ ස්ථාවරත්වය 2021 වසරේ පෙබරවාරි මාසයේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය කෙරෙහි හිතකර බලපෑමක් ඇති කළේය. 2021 වසරේ පෙබරවාරි මාසයේ වෙළඳ හිඟය මීට වසරකට පෙර වාර්තා වූ මට්ටමේම නොවෙනස්ව පැවතුණි. මූල්‍ය ගිණුම සැලකීමේ දී, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන හා සම්බන්ධ ශුද්ධ ගෙවීම් වාර්තා විය. 2020 ජූලි මාසයේ දී දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ පහසුකමක් වශයෙන් ඉන්දියානු සංචිත බැංකුව හරහා ලබා ගත් එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම කල් පිරීමෙන් අනතුරුව 2020 පෙබරවාරි මාසයේ දී ගෙවා නිම කරන ලදී. මාසය තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය ලිහිල් කළ අතර, ක්‍රියාත්මක කරනු ලැබූ නියාමනයන් හේතුවෙන්, ශුද්ධ පදනම මත, මහ බැංකුවට විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට අවකාශය සැලසුණි.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2020 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | 2021 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2020 ජන.- පෙබ. එ.ජ.ඩො. මිලියන | 2021 ජන.- පෙබ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 989 | 952 | -3.7 | 1,993 | 1,888 | -5.3 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,562 | 1,524 | -2.5 | 3,298 | 3,115 | -5.5 |
| වෙළඳ ශේෂය | -574 | -572 | | -1,304 | -1,227 | |
| සංචාරක ඉපැයීම් | 279 (ආ) | 5 (ඇ) | -98.4 | 586 (ආ) | 7 (ඇ) | -98.8 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 527 | 580 | 9.9 | 1,108 | 1,255 | 13.2 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -6 | -26 | | -22 | -70 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 90 | 93 | | 232 | 148 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (දළ) | 20 | 0.01 | | 79 | 3 | |
| දිගුකාලීන ණය (දළ) | 70 | 93 | | 153 | 145 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (දළ) | - | - | | - | - | |
| සමස්ත ශේෂය | | | | 310 | -774 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** 2021 වසරේ පෙබරවාරි මාසයේ වෙළඳ ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් මිලියන 572ක අගයක් ගත් අතර, 2020 වසරේ පෙබරවාරි මාසයේ වාර්තා වූ වෙළඳ ගිණුමේ හිඟය හා සැසඳීමේ දී බොහෝදුරට නොවෙනස්ව පැවතුණි. 2020 වසරේ පෙබරවාරි මාසය හා සැසඳීමේ දී 2021 පෙබරවාරි මාසයේ අපනයන සහ ආනයන සුළු වශයෙන් පහළ මට්ටමක පැවතුණි. මේ අතර, 2021 වසරේ ජනවාරි-පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,304 සිට එ.ජ. ඩොලර් මිලියන 1,227ක් දක්වා අඩු විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූපසටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2020 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2021 වසරේ පෙබරවාරි මාසයේ සියයට 3.5කින් පහළ ගිය අතර, අඩු අපනයන මිල ගණන් සහ ඉහළ ආනයන මිල ගණන් මෙයට හේතු විය.

**රූප සටහන 1: 2021 ජනවාරි - පෙබරවාරි මාසවල වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2020 -2021)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2020-2021)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

**සමස්ත අපනයන: 2021 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2020 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 952ක් දක්වා සියයට 3.7කින් පහළ ගියේය.** අපනයන ආදායම කොවිඩ්- 19 වෛරස ව්‍යාප්තියේ දෙවන රැල්ලේ උච්චතම අවස්ථාවේ සිට වසංගතයට පෙර පැවති මට්ටම දක්වා එනම්, 2020 වසරේ අනුරූප මාසයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 989 සහ 2019 වසරේ අනුරූප මාසයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 981 වෙත ළඟා වෙමින් යථා තත්ත්වයට පැමිණීමක් පෙන්නුම් කළේය.

**කාර්මික අපනයන:** 2021 වසරේ පෙබරවාරි මාසයේ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 6.3කින් පහත වැටුණු අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම සියයට 60.8කින් සහ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 5.3කින් පහත වැටීම හේතු විය. රට තුළට ගුවන් යානා සහ නැව් පැමිණීම අඩු වීම හේතුවෙන් නැව් සහ ගුවන් යානා සඳහා භාවිත කරන ඉන්ධන සැපයුම් පරිමාව කැපී පෙනෙන පහළ යෑම මෙන්ම එම අපනයන භාණ්ඩවල මිල ගණන් පහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. යුරෝපා වෙළඳපොළ වෙත ඇඟලුම් අපනයනය කිරීමෙන් ලද ආදායම ඉහළ ගිය අතර, ඇමෙරිකා එක්සත් ජනපදය සහ වෙනත් රටවල් වෙතින් ලැබුණු ආදායම පහළ ගියේය. සාපේක්ෂ වශයෙන් කුඩා අපනයන අංශ බොහොමයක ඉපැයීම් පහළ ගිය ද, රබර් නිෂ්පාදිත (ශල්‍ය සහ වෙනත් අත්වැසුම් සහ රබර් ටයර් අපනයනය ඉහළ යෑම හේතුවෙන්), යන්ත්‍ර සූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, ප්‍රවාහන උපකරණ, රසායනික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් සක්‍රිය කාබන්), ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන (ප්‍රධාන වශයෙන් ප්ලාස්ටික් ගෝනි, බෑග් සහ විනිල් බහුඅවයවයක) සහ පිඟන් මැටි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් පිඟන් භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ) අපනයන ආදායම ඉහළ ගියේය.

**කෘෂිකාර්මික අපනයන:** 2021 වසරේ පෙබරවාරි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම පසුගිය වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.9කින් ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් කුළුබඩු, පොල් සහ තේ අපනයන දායක විය. කුළුබඩු අපනයන ආදායම සැලකීමේ දී ගම්මිරිස්, කුරුඳු, සාදික්කා සහ වසාවාසි අපනයන ආදායම ඉහළ යෑම සඳහා මිල ගණන් මෙන්ම අපනයන පරිමාව ද දායක වූ අතර, කරාබුනැටි අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාව ඉහළ යෑම දායක විය. මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් තේ අපනයනයෙන් ඉහළ ආදායමක් ලැබුණු අතර, අපනයනය කරන ලද තේ පරිමාවේ පහළ යෑමක් වාර්තා විය. ප්‍රධාන වශයෙන් පොල් කෙඳි අපනයනය හේතුවෙන් පොල් අපනයන ආදායම ඉහළ ගියේය. ආහාරයට ගත හැකි ඇට වර්ග ආදී වූ සුළු කෘෂිකාර්මික අපනයන සහ මුහුදු ආහාර අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**ඛනිජ අපනයන:** 2020 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී ඛනිජ අපනයන ඉහළ ගිය අතර, ඒ සඳහා ටයිටේනියම් සහ සර්කෝනියම් ලෝපස්, ලෝබොර, මිනිරන් සහ මිනිරන් කුඩු අපනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

**අපනයන දර්ශක:** 2021 වසරේ පෙබරවාරි මාසයේ දී, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය, පිළිවෙලින් සියයට 1.6ක් සහ 2.2ක් ලෙස පහත වැටුණි. මෙමගින් අපනයන ආදායම පහත වැටීම සඳහා අපනයන පරිමා පහළ යෑමේ සහ මිල ගණන් පහළ යෑමෙහි ඒකාබද්ධ බලපෑම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2020 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2021 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2020 ජන.- පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2021 ජන.- පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **790.1** | **740.3** | **-6.3** | **1,602.7** | **1,472.6** | **-8.1** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 36.6 | 41.7 | 13.7 | 72.1 | 81.4 | 12.8 |
| සත්ත්ව ආහාර | 11.0 | 8.6 | -21.9 | 19.6 | 20.5 | 4.5 |
| රෙදිපිළි හා ඇඟලුම් | 468.1 | 443.3 | -5.3 | 942.2 | 866.3 | -8.1 |
| එයින්, ඇඟලුම් | 433.7 | 408.4 | -5.8 | 869.8 | 793.9 | -8.7 |
| රෙදිපිළි | 25.1 | 22.8 | -9.3 | 52.4 | 47.4 | -9.4 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 9.3 | 12.1 | 30.7 | 20.1 | 25.0 | 24.8 |
| රබර් නිෂ්පාදිත | 71.5 | 81.0 | 13.2 | 141.7 | 161.2 | 13.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 21.4 | 19.7 | -8.2 | 46.1 | 43.1 | -6.7 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 34.8 | 39.6 | 13.9 | 65.3 | 80.7 | 23.7 |
| ප්‍රවාහන උපකරණ | 6.9 | 9.0 | 30.0 | 14.1 | 15.8 | 11.9 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 57.8 | 22.7 | -60.8 | 140.6 | 57.1 | -59.4 |
| රසායනික නිෂ්පාදිත | 12.9 | 15.3 | 18.3 | 28.1 | 32.4 | 15.4 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.2 | 9.9 | -11.9 | 21.2 | 18.9 | -11.0 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.0 | 2.8 | -5.9 | 7.7 | 3.7 | -52.7 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.3 | 4.5 | -39.2 | 12.9 | 7.9 | -38.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.0 | 6.6 | 9.3 | 11.5 | 11.8 | 2.5 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 12.1 | 9.0 | -25.6 | 24.8 | 19.1 | -23.0 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.6 | 2.9 | 9.5 | 4.8 | 5.6 | 18.3 |
| වෙනත් කාර්මික අපනයන | 26.6 | 23.9 | -10.3 | 49.7 | 47.0 | -5.5 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **195.1** | **206.5** | **5.9** | **383.8** | **406.5** | **5.9** |
| තේ | 107.8 | 112.5 | 4.4 | 207.5 | 213.5 | 2.9 |
| රබර් | 3.1 | 2.7 | -12.9 | 5.8 | 6.7 | 14.1 |
| පොල් | 26.2 | 30.9 | 18.1 | 50.7 | 55.1 | 8.6 |
| කුළුබඩු | 18.7 | 33.1 | 77.6 | 38.1 | 75.2 | 97.1 |
| එළවළු | 2.4 | 1.5 | -35.4 | 5.0 | 3.2 | -36.4 |
| සකස් නොකළ දුම්කොළ | 1.7 | 2.4 | 39.8 | 3.4 | 4.6 | 37.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 14.7 | 9.2 | -37.1 | 29.0 | 17.3 | -40.4 |
| මුහුදු ආහාර | 20.6 | 14.1 | -31.6 | 44.2 | 31.0 | -30.0 |
| **3. ඛනිජ අපනයන** | **1.8** | **3.6** | **98.5** | **3.9** | **7.1** | **84.0** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.5** | **1.3** | **-15.0** | **3.0** | **2.2** | **-26.7** |
| **මුළු අපනයන** | **988.5** | **951.7** | **-3.7** | **1,993.4** | **1,888.4** | **-5.3** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

**සමස්ත ආනයන: 2021 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,524ක් දක්වා සියයට 2.5කින් පහළ ගියේය.** ආනයන වියදමෙහි වර්ධනය සඳහා අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සහ ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, අත්‍යවශ්‍ය නොවන ඇතැම් ආනයන භාණ්ඩ මත පැනවූ ආනයන සීමා හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය මත වන ආනයන වියදම තවදුරටත් සීමා විය.

**පාරිභෝගික භාණ්ඩ:** 2020 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 16.7කින් පහත වැටුණු අතර, ආහාර හා පාන වර්ග ආනයන වියදම සියයට 3.0කින් පහත වැටීම සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 26.4කින් පහත වැටීම මේ සඳහා හේතු විය. ආහාර හා පාන වර්ග ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගිය අතර, මේ සඳහා කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස්), පාන වර්ග (ප්‍රධාන වශයෙන් මත්පැන්), එළවළු (ප්‍රධාන වශයෙන් අර්තාපල්, කඩල, බී ළූණු, මෑ වර්ගයේ ඇට ආදිය) ඇතුළත් භාණ්ඩ ආනයන වියදම පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2020 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී ද ප්‍රධාන වශයෙන් පොල්තෙල් ආනයන වියදම ඉහළ යෑමෙන් තෙල් සහ මේද වර්ග ආනයන වියදම ඉහළ මට්ටමක පැවති අතර, ජාත්‍යන්තර වෙළඳපොළ මිල ගණන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගිය ද, පොල්තෙල් ආනයන සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2020 වසරේ දී අඩු කිරීම මේ සඳහා හේතු වූවා විය හැකිය. කිරිපිටි සහ සීනි ආනයන වියදම ද යම් තාක් දුරකට ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් පෞද්ගලික රථ වාහන ආනයනය අඩු වීම හේතු කොට ගෙන, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය පහළ යෑමට ලක් වුව ද, දුරකථන ආදී වූ ඇතැම් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. 2021 වසරේ පෙබරවාරි මාසයේ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම අතරට කොවිඩ් -19 එන්නත් සඳහා වැය කළ එ.ජ. ඩොලර් මිලියන 2.63ක් ද ඇතුළත් වේ.

**අන්තර් භාණ්ඩ:** 2021 වසරේ පෙබරවාරි මාසයේ දී 2020 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 3.8කින් ඉහළ ගියේය. මෙම කාණ්ඩය යටතේ ඉහළම ආනයන වියදම වාර්තා කරනු ලබන ඉන්ධන මත වූ වියදම පහළ යෑමක් වාර්තා කළ ද, අන්තර් භාණ්ඩ ආනයන බොහොමයක, විශේෂයෙන්ම, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, තිරිඟු (ප්‍රධාන වශයෙන් ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන්), රසායනික නිෂ්පාදිත, ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඉන්ධන ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 23.5කින් පහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් 2020 වසරට සාපේක්ෂව ආනයන පරිමා අඩු වීම හේතුවෙන් බොරතෙල්, පිරිපහදු කළ ඛනිජතෙල් සහ ගල් අඟුරු ආනයන වියදම පහළ යෑම මීට හේතු විය. 2020 වසරේ පෙබරවාරි මාසයේ ආනයන පරිමා ඉහළ අගයක් ගැනීමේ පදනම් බලපෑම් හේතුවෙන් ඉන්ධන ආනයන වියදමේ මෙම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අඩු වීම වාර්තා විය.

බොරතෙල් බැරලයක් සඳහා ආනයන මිලෙහි සාමාන්‍යය 2020 වසරේ දක්නට ලැබුණු එ.ජ. ඩොලර් 63.68ට සාපේක්ෂව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් 64.07ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත ආනයන මිලෙහි සාමාන්‍යය සුළු වශයෙන් පහළ ගියේය.

**ආයෝජන භාණ්ඩ:** 2020 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සියයට 4.7කින් පහළ ගියේය. ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අඩු වීමක් වාර්තා කළ ද, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදමෙහි ඉහළ යෑමක් වාර්තා වූ අතර, ඒ සඳහා පරිගණක, සම්ප්‍රේෂණ උපකරණ, ඇතැම් ඉංජිනේරු උපකරණ සහ කාර්මික හා කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර ආදී වූ භාණ්ඩ ආනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

**ආනයන දර්ශක:** 2021 වසරේ පෙබරවාරි මාසයේ දී ආනයන පරිමා දර්ශකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.9කින් පහත වැටුණු අතර, ඒකක මිල දර්ශකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 1.4කින් ඉහළ ගියේය. මෙමගින්, ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන පරිමා පහත වැටීම හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2020 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2021 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2020 ජන.- පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2021 ජන.- පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **327.3** | **272.7** | **-16.7** | **699.0** | **618.3** | **-11.5** |
| ආහාර හා පාන වර්ග | **135.8** | **131.8** | **-3.0** | **283.4** | **315.6** | **11.4** |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.5 | 2.9 | -35.1 | 9.9 | 6.7 | -32.4 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 28.0 | 31.7 | 12.9 | 64.3 | 54.8 | -14.8 |
| එළවළු (ආ) | 30.0 | 27.2 | -9.4 | 65.9 | 67.6 | 2.6 |
| මුහුදු ආහාර | 11.7 | 5.4 | -53.8 | 28.9 | 17.5 | -39.3 |
| සීනි හා රසකැවිලි | 25.8 | 29.1 | 12.8 | 45.8 | 86.6 | 88.9 |
| කුළුබඩු | 13.4 | 6.2 | -53.7 | 23.7 | 18.7 | -20.9 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.3 | 29.3 | 31.2 | 44.7 | 63.6 | 42.1 |
| ආහාර නොවන  පාරිභෝගික භාණ්ඩ | **191.4** | **140.9** | **-26.4** | **415.7** | **302.7** | **-27.2** |
| පෞද්ගලික රථවාහන | 53.6 | 0.9 | -98.3 | 116.9 | 1.4 | -98.8 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 42.2 | 41.2 | -2.4 | 91.0 | 86.0 | -5.5 |
| ගෘහ උපකරණ | 19.7 | 17.5 | -11.0 | 39.7 | 39.4 | -0.6 |
| රෙදිපිළි හා උපාංග | 27.8 | 17.4 | -37.2 | 58.0 | 35.9 | -38.0 |
| විදුලි සංදේශ උපකරණ | 18.0 | 30.8 | 71.6 | 41.3 | 69.2 | 67.6 |
| ගෘහ හා දැව භාණ්ඩ | 13.2 | 13.8 | 5.0 | 31.0 | 29.5 | -4.9 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 17.1 | 19.3 | 12.8 | 37.8 | 41.2 | 9.0 |
| **2. අන්තර් භාණ්ඩ** | **911.5** | **945.9** | **3.8** | **1,846.0** | **1,860.8** | **0.8** |
| ඉන්ධන | 418.7 | 320.2 | -23.5 | 710.6 | 630.0 | -11.3 |
| එයින්, බොරතෙල් | 93.4 | 44.9 | -52.0 | 140.3 | 127.1 | -9.5 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 289.4 | 246.5 | -14.8 | 496.6 | 443.0 | -10.8 |
| ගල්අඟුරු | 35.9 | 28.8 | -19.7 | 73.6 | 59.9 | -18.6 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 6.3 | 12.1 | 91.6 | 20.2 | 23.1 | 14.4 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 182.0 | 222.8 | 22.4 | 482.8 | 459.2 | -4.9 |
| කඩදාසි හා ඝන  කඩදාසි | 32.3 | 31.9 | -1.4 | 70.5 | 63.1 | -10.4 |
| කෘෂිකාර්මික යෙදවුම් | 15.7 | 19.3 | 23.6 | 36.3 | 42.5 | 17.0 |
| තිරිඟු හා ඉරිඟු | 8.4 | 55.5 | 558.6 | 17.3 | 62.4 | 260.1 |
| මූල ලෝහ | 20.4 | 28.2 | 37.9 | 45.6 | 66.9 | 46.6 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 45.2 | 57.8 | 27.9 | 94.9 | 117.1 | 23.5 |
| රසායනික නිෂ්පාදිත | 64.4 | 77.4 | 20.2 | 138.5 | 165.5 | 19.5 |
| පොහොර | 13.2 | 14.0 | 5.7 | 19.2 | 18.7 | -2.6 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 24.3 | 34.4 | 41.5 | 46.9 | 60.5 | 28.9 |
| ඛනිජ නිෂ්පාදිත | 13.3 | 7.5 | -43.3 | 26.0 | 19.8 | -24.0 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 67.2 | 64.8 | -3.6 | 137.1 | 131.9 | -3.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **318.8** | **303.7** | **-4.7** | **747.0** | **633.8** | **-15.2** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 183.5 | 193.8 | 5.6 | 442.1 | 410.5 | -7.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 102.5 | 89.2 | -13.0 | 221.8 | 176.9 | -20.2 |
| ප්‍රවාහන උපකරණ | 32.6 | 20.6 | -36.8 | 82.5 | 46.1 | -44.1 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.1 | -58.5 | 0.7 | 0.3 | -55.4 |
| **4. වර්ග නොකළ ආනයන** | **4.8** | **1.3** | **-72.5** | **5.7** | **2.3** | **-59.5** |
| **මුළු ආනයන** | **1,562.3** | **1,523.6** | **-2.5** | **3,297.7** | **3,115.2** | **-5.5** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,143.6** | **1,203.4** | **5.2** | **2,587.1** | **2,485.2** | **-3.9** |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා  මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**විදේශිකයින් සඳහා රටේ දේශසීමා විවෘත කිරීමෙන් පසුව සංචාරක අංශය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්විය.** ඒ අනුව, 2021 වසරේ ජනවාරි මාසයේ සංචාරක පැමිණීම් වූ 1,682ට සාපේක්ෂව, 2021 පෙබරවාරි මාසයේ සංචාරක පැමිණීම් 3,366ක් වාර්තා විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ව්‍යාප්තියට පෙර, 2020 වසරේ පෙබරවාරි මාසයේ වාර්තා වූ සංචාරක පැමිණීම් වන 207,507ට වඩා 2021 වසරේ පෙබරවාරි මාසයේ දී සංචාරක පැමිණීම් සියයට 98.4ක අඩු මට්ටමක පැවතුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වසරේ ජනවාරි-පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 435,941ට සාපේක්ෂව 5,048ක් ලෙස වාර්තා විය. 2021 වසරේ පෙබරවාරි මාසය තුළ, වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණි රටවල් වූයේ කසකස්තානය, යුක්රේනය සහ ජර්මනිය යි. සංචාරකයින්ගේ පැමිණීම් මත පදනම්ව ඇස්තමේන්තු කරනු ලබන සංචාරක ඉපැයීම්, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5 සමඟ සැසඳීමේ දී 2020 වසරේ අනුරූප මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 279ක් විය. ඒ අනුව, 2021 වසරේ ජනවාරි-පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 7ක් විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2021 වසරේ පෙබරවාරි මාසයේ දී තවදුරටත් වර්ධනය විය**. 2021 වසරේ පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 580ක් දක්වා සියයට 9.9කින් වර්ධනය විය. 2021 වසරේ ජනවාරි-පෙබරවාරි දක්වා කාලය තුළ දී වාර්තා වූ මුළු විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,255ක් වූ අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 13.2ක වර්ධනයකි.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

**රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන මාසය තුළ සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.** 2021 පෙබරවාරි මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 2ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, එමගින් 2021 ජනවාරි සිට පෙබරවාරි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සමුච්චිත පදනම මත ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1.0ක් දක්වා පහළ ගියේය. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2021 වසරේ පෙබරවාරි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 36ක අඩු මට්ටමක පැවතුණි.

2021 වසරේ පෙබරවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 26ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය සමුච්චිත පදනම මත, 2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසන් වූ මාස දෙක තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 70ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

මේ අතර, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී රජය වෙත වූ දිගු කාලීන ණය එ.ජ. ඩොලර් මිලියන 22ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

**2021 වසරේ පෙබරවාරි මාසය අවසානය වන විට, දළ නිල සංචිත මට්ටම එ.ජ. ඩොලර් බිලියන 4.6ක් විය.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය වෙතින් ලබා ගත් එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම කල් පිරීමත් සමඟ 2021 වසරේ පෙබරවාරි මාසයේ දී පියවන ලදී. 2021 වසරේ පෙබරවාරි මාසය අවසානයේ පැවති දළ නිල සංචිත ආනයනික මාස 3.5කට සමාන විය. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2021 වසරේ පෙබරවාරි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 7.3ක් වූ අතර, එම ප්‍රමාණය මාස 5.5ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් විය.

**සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ගනුදෙනුකරුවන් වෙතින් වූ ලැබීම් වැඩි වීම හේතුවෙන් 2021 වසරේ පෙබරවාරි මාසය තුළ විනිමය අනුපාතිකය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි.** ඒ අනුව, පෙබරවාරි මාසය තුළ, එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 0.2කින් සුළු වශයෙන් අතිප්‍රමාණය විය. 2021 වසරේ පෙබරවාරි 18 වන දින සිට රුපියල්වලට පරිවර්තනය කරන සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් සියයට 10ක් සහ අපනයන ආදායම් ලැබීම්වලින් සියයට 50ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම සඳහා සියලුම බලපත්‍රලාභී බැංකු වෙත නියාමන යොමු කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවට මාසය තුළ දී ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 23ක් මාසය තුළ දී අවශෝෂණය කර ගැනීමට හැකි විය. සමස්තයක් ලෙස, 2021 වසරේ අප්‍රේල් 16 වන දින දක්වා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.8කින් අවප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, මෙම කාලපරිච්ඡේදය තුළදී, ශ්‍රී ලංකා රුපියල, යුරෝ, ස්ටර්ලිං පවුම, ඔස්ට්‍රේලියානු ඩොලරය, ජපන් යෙන් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 | 2021 (අප්‍රේල් 16 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | -2.6% | -6.8% |
| යුරෝ | +2.6% | -11.2% | -4.0% |
| ස්ටර්ලින් පවුම | -2.8% | -6.2% | -7.5% |
| ජපන් යෙන් | -1.0% | -7.5% | -1.5% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | -11.4% | -7.0% |
| ඉන්දියානු රුපියල | +2.6% | 0.0% | -4.9% |